# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2010 අංක 4 දරන සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 පෙබරවාරි මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 පෙබරවාරි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

# 2010 අංක 4 දරන සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 පෙබරවාරි මස 09 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 11/2008.

## සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීම) සඳහා වූ පනතකි

පූර්විකාව.

"සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන කේන්ද්‍රය, එහි සාමාජිකයන් විසින් එකඟ වන ලද රීති අනුව, එකී කේන්ද්‍රය සම්බන්ධව සියලු පරමාර්ථ හා අරමුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ගම්පොල කොබ්බෑවල ශ්‍රී ප්‍රියදර්ශනාරාම පුරාණ රාජමහා විහාරස්ථානයේ ආරම්භ කර තිබූ හෙයින් ද :

එකී කේන්ද්‍රය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා එම කේන්ද්‍රය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී කේන්ද්‍රය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන සුභසිද්ධිය පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2010 අංක 4 දරන සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු, (මෙහි මින් මතු "කේන්ද්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුලත් කරගනු ලබන තැනැත්තන් ද, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරිය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ මෙහි පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාව තුළ වාසය කරන දිළිඳු පවුල්වල ආර්ථික තත්ත්වය නගා සිටුවීම ;

(ආ) එකී දිළිඳු පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනික තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා වූ රජයේ වැඩ පිළිවෙලට සහය වීම ;

(ඇ) එකී පවුල්වල දුප්පත්කම මුලිනුපුටා දැමීම සඳහා සහාය වීම සහ උපකාර කිරීම මෙන්ම දුප්පත් අයගේ මූල්‍යමය තත්ත්වය වැඩිදියුණු කිරීම ;

(ඈ) පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීමේ කටයුතුවලට සහාය වීම ;

(ඉ) සමාජ මෙහෙයුම් ව්‍යාපෘති තුලින් සෞඛ්‍ය හා පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීම සහ සමාජ සුභසාධන කටයුතු සඳහා සහාය ලබාදීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක වෙනත් යම් ආයතන හෝ සංවිධාන සමග එක්ව කටයුතු කිරීම ;

(උ) ආධාර අවශ්‍ය අඩු ආදායම් ලාභී පවුල්වල ශිෂ්‍යයන්ට පොත්, උපකරණ, ඇඳුම් පැළඳුම්, ණය මුදල් හා මූල්‍ය ප්‍රතිපාදන සපයා දීමට සහයදීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනයේ යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් පහ කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා කාරණා සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**5.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව විධායක අධ්‍යක්ෂ, සභාපති, පරිපාලන ලේකම්, භාණ්ඩාගාරික සහ එකී රීති ප්‍රකාරව තෝරා පත් කර ගනු ලබන දහනව දෙනකුට අඩු නොවන සහ විසිතුන් දෙනකුට වැඩි නොවන කමිටු සාමාජිකයන් ගණනකින් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ පළමු කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කේන්ද්‍රයේ ධුර දරන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

**6.** (1) ගම්පොල, කොබ්බෑවල ශ්‍රී ප්‍රියදර්ශනාරාම පුරාණ රාජමහා විහාරයේ විහාරාධිපති සංස්ථාවේ විධායක අධ්‍යක්ෂ විය යුතු ය.

විධායක අධ්‍යක්ෂ.

(2) විධායක අධ්‍යක්ෂවරයා, අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ වෙනත් යම් හේතුවක් නිසා එම ධුරයේ තාවකාලිකව කාර්ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවල, ඔහු විසින්, ඔහු නොමැති කාලය තුළ එම කාර්ය ඉටු කිරීම සඳහා, ශ්‍රී ප්‍රියදර්ශනාරාම පුරාණ රාජමහා විහාරයේ ජ්‍යෙෂ්ඨතම භික්ෂුව නම් කරනු ලැබිය යුතු ය.

(3) කේන්ද්‍රයේ යාවජීව අනුශාසක සහ විධායක අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ශ්‍රී ප්‍රියදර්ශනාරාම පුරාණ රාජමහා විහාරයේ විහාරාධිපති, ගරු කොබ්බෑවල සිරිනිවාස නාහිමි, සංස්ථාවේ ප්‍රථම විධායක අධ්‍යක්ෂ විය යුතු ය.

**7.** (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කිරීම, ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධාරී මඬුල්ල තෝරා පත් කර ගැනීම, ඔවුන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍යය මෙන්ම ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, විනය පාලනය, කාර්ය සහ කර්තව්‍යය ;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී හෝ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම්වල වේලාවන්, ස්ථාන, දැන්වීම් සහ න්‍යාය පත්‍රය, එහි ගණපූර්ණය සහ එම රැස්වීම්වල කටයුතු පැවැත්වීම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය, එහි අරමුදල් භාරයේ තබා ගැනීම සහ ස්වකීය ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද සෑම රීතියක්ම (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ආකාරයට එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ මුද්‍රාව—

(අ) විධායක අධ්‍යක්ෂවරයාගේ සහ සභාපති ස්වාමීන් වහන්සේගේ භාරයේ තැබිය යුතු ය.

(ආ) කළමනාකරණ කමිටුවේ කැමැත්ත ඇතිව මිස සහ තමන් පැමිණ සිටින බවට තහවුරු කිරීමට සාධන පත්‍රයේ අත්සන් තබන දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ බඳු දීමක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර සතුකර ඇති යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර එම සියලු දේපළ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, විකිණීමට, උකස් කිරීමට, බඳු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවා දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**12.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග හෝ දායක මුදල් වශයෙන් ලැබෙන සියලු මුදල් සභාව විසින් තීරණය කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරන ලද සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.